## කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය - 2014

---------------------------------------------------------------------------------------------

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන් ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03

(i) පෙර කාලපරිච්ඡේදවල වරදෙහි ස්වභාවය සහ රේඛීය අයිතමයන් සඳහා නිවැරදි කළයුතු මුදල හෙළිදරව් කළයුතු වුවත් සියළුම පෙර වර්ෂ ගැලපුම්, ලෙජර් ගිණුමක් ආශ්‍රයෙන් ගලපා එම ගිණුමේ වූ රු.928,781 ක හර ශේෂය සමුච්චිත ඌනතාවයට ගලපා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වෙනස් කිරීම සම්බන්ධයෙන් එලෙස වෙනස් කිරීමට හේතුව සහ අතීතානුයෝගීව ගිණුම්කරණ ප්‍රතිපත්තිය ව්‍යවහාර කළා සේ සලකා අදාළ ගිණුම් ශේෂයන්හි ධාරණ අගයන්ට ගලපා සන්සන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07

(i) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ එහෙත් තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන පිරිවැය රු.26,058,970 ක් වූ ස්ථාවර වත්කම්වල සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) දේපල පිරියත හා උපකරණ බැහැර කිරීමේදි ඇතිවන වාසි හෝ අවාසිය ගැලපිය යුතු නමුත් අබලි භාණ්ඩ ලෙස 2014 දෙසැම්බර් මාසයේදී ඉවත් කරන ලද ඒකක 102 කට අදාළ පිරිවැය හා සමුච්චිත ක්ෂය සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි.

#### 2.2.2 නොසැසඳු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගිණුම් විෂයයන් 07 ක ශේෂ, උපලේඛන හා වාර්තාවල ශේෂ සමඟ සැසඳීමේදී එකතුව රු.3,436,611 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

ආයතන 06 ක් වෙත ගෙවා තිබූ එකතුව රු.104,408 ක් වූ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් වන වාර්තා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය ප්‍රකාරව විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.985,307 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව, ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.215,893 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.769,414 කින් පිරිහී තිබුණි. වියදම රු.288,712 කින් අඩුවී තිබුණද ගාස්තු, දඩ හා බලපත්‍ර ආදායම රු.1,043,119 කින් අඩුවීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. වාර්ෂිකව ඌනතාවය ඉහලයාම හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ඌනතාවය රු.27,495,077 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලියේ 4 (අ) සහ (ඇ) වගන්ති ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා නොගෙන 2003 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පශ්චාත් උපාධි පාඨමාලා 36 ක්ද , ඩිප්ලෝමා පාඨමාලා 15 ක් ද, සහතික පත්‍ර පාඨමාලා 37 ක් ද වශයෙන් පාඨමාලා 88 ක් ආරම්භ කර සිසුන් 1,533 දෙනෙකු ලියාපදිංචි කර තිබූ අතර ඉන් සිසුන් 789 දෙනෙකු සඳහා සහතිකපත් පිරිනමා තිබුණි.

(ආ) ආයතනය විසින් 2003 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ආරම්භ කර තිබූ පාඨමාලා 15 කින් පාඨමාලා 13 ක විෂය නිර්දේශ සංශෝධනය කර නොතිබුණි.

(ඇ) සිසුන් 07 දෙනෙකු පමණක් ලියාපදිංචි වී තිබූ 2007 වර්ෂයේ ආරම්භ කරන ලද දර්ශනපති / දර්ශනශූරී 2007/2010 තුන් අවුරුදු පාඨමාලාව වසර 08 ක් පමණ ගතවී ඇතත් අවසන් කිරීමට නොහැකි වී තිබූ අතර සිසුන් පස් දෙනෙකු පාඨමාලාව හැරගොස් තිබුණි. තවත් පාඨමාලා 05 ක් නිම කිරීමට සැලසුම් කළ දිනට වඩා මාස 03 සිට මාස 07 කට අධික කාලයක් ගත වී තිබුණද අවසන් කිරීමට නොහැකි වී තිබුණි.

(ඈ) ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් අයදුම් නොකිරීම හේතුවෙන් පාඨමාලා 05 ක් ද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් තවත් පාඨමාලා හා පුහුණු වැඩසටහන් 09 ක් ද පැවැත්වීමට නොහැකි වී තිබුණි.

(ඉ) කාර්තුමය වශයෙන් ප්‍රකාශයට පත්කිරීමට සැලසුම් කරන ලද සිංහල හා දෙමළ මුද්‍රිත ප්‍රවෘත්ති පත්‍රිකා සමාලෝචිත වර්ෂයේදී ප්‍රකාශයට පත්කිරීමට නොහැකි වී තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් භාරගැනීම සඳහා ස්ථිර නිලධාරියෙකු පත් නොකිරීම, මුදල් පොත දෛනිකව තුලනය නොකිරීම, එහි ඇතුළත් සංඛ්‍යා අනුමැතියකින් තොරව වෙනස් කිරීම, අනුක්‍රමික අංක පිළිවෙලට ලදුපත් නිකුත් නොකිරීම හා එම අංක වෙනස් කර ඇති අවස්ථා තිබීම, දෛනික ලැබීම් හා ගෙවීම් ක්‍රමානුකූලව මුදල් පොතට ඇතුළත් නොකළ අවස්ථා තිබීම, චෙක්පොත් නිකුත් කිරීමේ ලේඛනයක් නොපැවැත්වීම, ලියන ලද චෙක්පත් නිතර නිතර අවලංගු කිරීම හා සමාලෝචිත වර්ෂයේදී රු.2,355,625 ක් වටිනා චෙක්පත් 81 ක් අවලංගු කර තිබීම,

චෙක්පත් අංක හා වටිනාකම් මුදල් පොත හා ගෙවීම් වවුචර් අතර වෙනස්වන අවස්ථා තිබීම, අවලංගු කළ චෙක්පත් ලේඛනය අසම්පූර්ණ වීම වැනි කරුණු හේතුවෙන් මූල්‍ය පාලනය අසතුටුදායක තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ලෝක බැංකුවේ දෙවන සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය යටතේ ගුරු පුස්තකාලයාධිපතිවරු පුහුණු කිරීම සඳහා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය ස්ථාපිත කර තිබූ අතර, 2009 අගෝස්තු 27 දිනැති අංක 09/1488/316/055 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් පුස්තකාල හා තොරතුරු විද්‍යා ගුරුවරුන් (ගුරු පුස්තකාලයාධිපතිවරුන්) විසින් ලබාගත යුතු වෘත්තීය සුදුසුකම්, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි. එසේ වුවද, මේ වන තෙක් ගුරු සේවා ව්‍යවස්ථාවට අදාළ වෘත්තීය සුදුසුකම් ඇතුළත් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලියේ 7 (3) වගන්තිය ප්‍රකාරව ආයතනයේ සංවිධාන ව්‍යුහය තුළට උසස් උපාධි කමිටුවක් ඇතුළත් කර තිබුණ ද ආයතනය තුළ උසස් උපාධි කමිටුවක් පිහිටුවා නොතිබූ අතර දර්ශනපති / දර්ශනශූරී පාඨමාලා ව්‍යවස්ථාව අනුව උසස් උපාධි කමිටුවක් මගින් සිදුවිය යුතු එම පාඨමාලාවට අදාළ කාර්යයන් ශාස්ත්‍රීය කමිටුව හරහා සිදුකර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ තොග පාරිභෝජන වියදම රු.406,023 ක් වුවද තොග නිකුත් කිරීම සම්බන්ධයෙන් විධිමත් පාලන ක්‍රම හඳුන්වා දී නොතිබුණි.

## 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

2003 වර්ෂයේදී ආයතනය ගොඩනැගීම සඳහා සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතියෙන් (GEP2) ලැබුණු රු.2,700,000 ක් අරමුණුගත කාර්යයෙහි නොයොදවා වර්ෂ ගණනාවක් තිස්සේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පෙර වර්ෂයේ ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීම බාහිර පාර්ශවයකට පවරා තිබූ අතර එම දෝෂ සම්පූර්ණයෙන් නිවැරදි කර නොතිබියදී රු.30,000 ක දීමනාවක් ගෙවා තිබුණි.

(ආ) 1995 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය විසින් නිශ්චිතව අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් සිය සේවකයින්ට ගෙවිය යුතු වුවත් එලෙස අනුමැතිය ලබා නොගෙන පැවරුම් පදනම මත බඳවාගත් නිලධාරියෙකුට හා කාර්යමණ්ඩලයේ නිලධාරින් 4 දෙනෙකු වෙත පාඨමාලා සම්බන්ධීකරණ ගාස්තු හා සහායක ගාස්තු ලෙස රු.131,533 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂය අවසාන දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 04 ක් පුරප්පාඩු වී තිබුණි. ඉන් මාණ්ඩලික නොවන පුරප්පාඩු තනතුරු 03 ක් සඳහා 2007 සහ 2011 වර්ෂයන්හි සිට පැවරුම් පදනම මත බඳවාගත් නිලධාරින් තිදෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් විය යුතු සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම, අයවැය ලේඛනය, ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය අනුව අයවැය ලේඛනය සමඟ අයවැයගත ආදායම් ප්‍රකාශනය, ශේෂ පත්‍රය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අයවැයගත හා තථ්‍ය ආදායම්, වියදම් අතර සියයට 10 සිට සියයට 112 දක්වා පරාසයක විචලනයන් පැවතීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ලේඛන පවත්වාගෙන යාම
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ගබඩා පාලනය
(ඊ) අයවැය පාලනය
(උ) අත්තිකාරම් පාලනය
(ඌ) ප්‍රසම්පාදන කටයුතු